**ශීර්ෂ 312 - බස්නාහිර පළාත් සභාව - 2025**

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සහජීවනය සහ තිරසාර සංවර්ධනය තුළින් බස්නාහිර පළාත පෙරට

**1.2 මෙහෙවර**

මූල්‍ය, භෞතික හා මානව සම්පත් ප්‍රශස්ථ ලෙස මෙහෙයවමින් සියළු ප්‍රජාවට සෙත සැළසෙන සාමය හා සහජීවනයෙන් පිරි තිරසාර සංවර්ධනයක් උදාකිරීම.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. මුළු ප්‍රතිපාදනය හා වියදම**

බස්නාහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 84,581.00 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් රු.මිලියන 82,331.85 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,249.15 ක් හෙවත් සියයට 2.65 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2025 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % |
| පුනරාවර්තන | 76,734.00 | 75,082.24 | 1,651.76 | 2.15 |
| මූලධන | 7,847.00 | 7,249.61 | 597.39 | 7.61 |
| එකතුව | 84,581.00 | 82,331.85 | 2,249.15 | 2.65 |

**3. විගණන නිරීක්ෂණය**

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනය කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳව විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.